සියළුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# අවසාන වාර පරීක්ෂණය 2024

# ප්‍රායෝගික තාක්ෂණ කුසලතා

**8 ශ්‍රේණිය** **කාලය පැය 2 යි.**

නම/ විභාග අංකයඃ

## I කොටස

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- අංක 01 - 10 දක්වා වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. මිනිසා විසින් ඉදිකරනු ලැබූ අවපාත තුළ වැසි ජලය එක්රැස් වී ජලය රඳාපවතින ජලාශයකි,
(1) ගංගා (2) වැව් (3) උල්පත් (4) ඇළදොළ

02. යෝගට් සෑදීමේ දී 42 °C උෂ්ණත්වයක් ලබාදේ. එම උෂ්ණත්වය යටතේ යෝගට් නිශ්චලව තැබිය යුතු කාලය,
(1) පැය 4 - 5 (2) පැය 4 - 6 (3) පැය 5 - 6 (4) පැය 5 - 7


03. බෙල්ලන්විල අත්තිඩිය යනු,
(1) වගුරකි. (2) ගං මෝයකි. (3) කලපුවකි. (4) ගංගාවකි.

04. නීරමුල්ලිය ශාකය යනු,
(1) පුෂ්පයකි. (2) ඖෂධයකි.
(3) හස්ත කර්මාන්තයට යොදාගනී. (4) ජලජ ශාකයකි.

05. හස්ත හා විසිතුරු කර්මාන්තයට යොදාගත හැකි ශාකයකි,
(1) නෙළුම් (2) ගල්ලැහැ (3) ලුණුවිල (4) කිරල

06. ජලාශවල ඇල්ගී වැනි ක්ෂුද්‍ර ජීවී ශාක අධික ලෙස වර්ධනය වීම නිසා ජලය කොළ පැහැයක් ගනී. මෙම තත්ත්වය වනුයේ,
(1) ගෝලීය උණුසුම ඉහළ යාම (2) ඉඩෝරය
(3) පාංශු ඛාදනය (4) සුපෝෂණය

07. හරිතාගාර වායුවකි,
(1) මීතේන් (2) නයිට්‍රජන් (3) හයිඩ්‍රජන් (4) ඇමෝනියා

08.  මෙම සංකේතය අයත් උපාංගය වනුයේ,
(1) ප්‍රතිරෝධක (2) ධාරිත්‍රක
(3) ස්විචය (4) ආලෝක විමෝචක ඩයෝඩ

09. නිෂ්පාදන පිරිවැයෙහි මූලිකාංගයක් / මූලිකාංග වනුයේ,
(1) ද්‍රව්‍ය පිරිවැය (2) ශ්‍රම පිරිවැය (3) පොදුකාර්ය පිරිවැය (4) මේ සියල්ල ම

10. මුළු නිෂ්පාදන පිරිවැය සෙවීම සඳහා අවශ්‍ය වනුයේ,
(1) භාණ්ඩයේ මිල (2) සෘජු පිරිවැය (3) ශ්‍රම වියදම (4) බදු කුලී ගෙවීම්

- **පිළිවෙළින් පෙළගස්වන්න.**

  පසු අස්වනු හානිය පිළිබඳ ව ව්‍යාපෘතියක් සැලසුම් කිරීමේ දී පහත කරුණු පිළිබඳ අවධානය යොමුවෙයි. ඒවා පිළිවෙළින් පෙළගැස්වීමට හිස් කොටුවේ අංකය යොදන්න.

| | | |
|---|---|---|
| 11. | පිරිසිදු කිරීම | |
| 12. | ශ්‍රේණිගත කිරීම | |
| 13. | අස්වනු නෙළීම | |
| 14. | ප්‍රවාහනය / ගබඩා කිරීම | |
| 15. | ඇසිරීම | |
| 16. | පරිභෝජනය | |
| 17. | සැකසීම | |

- **හිස් තැන් පුරවන්න.**

(ලවණ / කිවුල්දිය / මිරිදිය / භූගත ජලය / ග්ලැසියර්)

18. ජලය පිහිටා තිබෙන ස්ථාන අනුව .................................................... ඉන් එක් කොටසකි.
19. මුතුරාජවෙල ........................................................................................ වගුරකි.
20. මූන්දලම කලපුව .................................................................................. වගුරකි.

(ලකුණු 1 x 20 = 20)

## II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. ඉතිරි ප්‍රශ්නවලින් දෙකක් තෝරාගෙන ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.**

01. (1) භෝග වගාවට හානි කරන කෘමි සතුන් ඉවත්කිරීමට භාවිත කරන ඇටවුම් 2 ක් නම් කරන්න.
    (2) ආක්‍රමණශීලී වල් පැළෑටි 2 ක් නම් කරන්න.
    (3) වෙළෙඳ ප්‍රචාරණයේ මූලිකාංග 2 ක් ලියන්න.
    (4) අධි ශීතකරණ කුටියේ ගබඩා කළ යුතු ආහාර වර්ග 2 ක් ලියන්න.
    (5) නරක් වූ ආහාරයක ලක්ෂණ 2 ක් ලියන්න. (ල. 2 x 5 = 10)

02. (1) සැලසුම් සහගත ගෙවත්තකින් ලබාගත හැකි ප්‍රතිලාභ 3 ක් ලියන්න. (ල. 03)
    (2) ගෙවත්තක් සැකසීමේ දී සැලකිය යුතු කරුණු 3 ක් ලියන්න. (ල. 03)
    (3) පාංශු ඛාදනය වැළැක්වීමට ගත හැකි පියවර 4 ක් ලියන්න. (ල. 04)

03. (1) වෙළෙඳපොළක අංග 3 නම් කරන්න. (ල. 03)
    (2) ඉලක්ක වෙළෙඳපොළක් ඛණ්ඩනය කළ යුතු ආකාරය නිගමනය කිරීමේ දී නිෂ්පාදකයෙකු විසින් අධ්‍යයනය කරනු ලබන ප්‍රජා සාධක 3 ක් ලියන්න. (ල. 03)
    (3) ඉලක්ක වෙළෙඳපොළ තෝරාගැනීමේ වාසි 2 ක් ලියන්න. (ල. 04)

04. (1) පහත උපාංගවල සංකේත අඳින්න. (ල. 03)
        1. ස්විචය
        2. ධාරිත්‍රක
        3. විචල්‍ය ප්‍රතිරෝධක
    (2) අවකාශ කළමනාකරණයේ දී සීමිත ඉඩකඩක් වැඩි ඵලදාවක් සහිත ව භාවිතය සඳහා නිර්මාණ කරන උපක්‍රම 3 ක් ලියන්න. (ල. 03)
    (3) ඉහත සඳහන් උපක්‍රම අතරින් 2 ක් පිළිබඳ ව කෙටියෙන් හඳුන්වන්න. (ල. 04)

05. (1) වෙළෙඳපොළ සමීක්ෂණය සඳහා යොදාගන්නා ක්‍රම 3 ක් ලියන්න. (ල. 03)
    (2) පරිසර දූෂණයවීම කෙරෙහි බලපාන ව්‍යාපාරික ක්‍රියාකාරකම් 3 ක් ලියන්න. (ල. 03)
    (3) එදිනෙදා භාවිත කරන උපකරණ හා යන්ත්‍ර සූත්‍රවල ඇතිවිය හැකි දෝෂ මොනවා ද? (ල. 04)

- **ප්‍රායෝගික පරීක්ෂණය සඳහා ලකුණු 50 කි.**

**2024 - අවසාන වාර පරීක්ෂණය - ප්‍රායෝගික තාක්ෂණ කුසලතා - 08 ශ්‍රේණිය පිළිතුරු පත්‍රය**

I කොටස

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| (01) | 2 | (02) | 2 | (03) | 1 | (04) | 2 | (05) | 2 | (06) | 4 | (07) | 1 | (08) | 2 |
| (09) | 4 | (10) | 2 | (11) | 2 | (12) | 3 | (13) | 1 | (14) | 5 | (15) | 4 | (16) | 7 |
| (17) | 6 | (18) | භූගත ජලය | (19) | කිවුල්දිය | (20) | ලවණ | | | | | | | | |

(ලකුණු 1 x 20 = 20)


II කොටස - පිළිතුරු

01. (1) පෙරමෝන උගුල / ආලෝක උගුල
(2) ජපන් ජබර / සැල්වීනියා
(3) සන්නිවේදනය / දිරිගැන්වීම / ආරාධනය
(4) අයිස්ක්‍රීම් / මස් / මාළු
(5) වර්ණය වෙනස්වේ / සෙවල බව / රසය වෙනස්වේ / දුර්ගන්ධය / අහිතකර ක්ෂුද්‍ර ජීවීන් අන්තර්ගත වේ

02. (1) වස විසෙන් තොර නැවුම් ආහාර ලැබීම / අමතර ආදායමක් ලැබීම / මානසික වින්දනයක් ලැබීම / කෘෂි ව්‍යවසායකත්වයට යොමුවීම
(2) ගෙවත්තෙහි විශාලත්වය අවධානයට ගැනීම / සුදුසු භෝග වර්ග තේරීම / පාංශු ඛාදනය වළක්වා ගැනීම / ජල සැපයුම පිළිබඳ අවබෝධය
(3) පස මතුපිට ජීව හා අජීව බාධක යෙදීම / හෙල්මළු ආකාරයට බිම් සැකසීම / පස ආවරණ භෝග සිටුවීම / පසට වසුන් යෙදීම

03. (1) විකුණුම්කරුවන් / ගැනුම්කරුවන් / මෙම දෙපාර්ශවය අතර ගනුදෙනු
(2) වයස / ස්ත්‍රී, පුරුෂ බව / ජීවන රටාව / භූගෝලීය පිහිටීම / ජන වර්ගය / අපේක්ෂා / අවශ්‍යතා, වුවමනා
(3) පාරිභෝගික අවශ්‍යතා වෙන්කර ගැනීම පහසුවීම / අවශ්‍ය ඒකක ප්‍රමාණය තීරණය කළ හැකි වීම / අළෙවි ප්‍රවර්ධනය පහසු වීම

04. (1) ධාරිත්‍රක ස්විච්චය විචල්‍ය ප්‍රතිරෝධක



(2) හකුලා තැබීමේ උපක්‍රම / භාවිත නොකළ ඉඩකඩ යොදාගැනීමේ උපක්‍රම / බහුකාර්ය කිරීමේ උපක්‍රම
(3) පිළිතුරට ලකුණු ලබාදීම

05. (1) වෙළඳපොල පරීක්ෂණ / වෙළඳපොල නිරීක්ෂණ / ප්‍රශ්නාවලි ඉදිරිපත් කිරීම
(2) අපද්‍රව්‍ය පරිසරයට මුදාහැරීම / නොදිරන අපද්‍රව්‍ය පරිසරයට ඒකරාශි කිරීම / විෂ සහිත වායු වර්ග පරිසරයට එකතු කිරීම / ජලජ හානී නිසා ජලජ ජීවීන් විනාශ වීම
(3) ක්‍රියාකාරී නොවීම / චලිත කරවීම අපහසු වීම / අනවශ්‍ය ශබ්ද ඇතිවීම / නිසිලෙස ක්‍රියාත්මක නොවීම

- **ප්‍රායෝගික පරීක්ෂණය සඳහා ලකුණු 50 කි.**